# සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

# විදුලි කාර්මික III ශ්‍රේණිය

ශ්‍රී ලංකාවේ බෙදාහැරීමේ උපයෝගීතා සමාගමක් වන සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම ශාඛා හතක් මගින් මීගමුව සිට ගාල්ල දක්වා වෙරළබඩ තීරය ආවරණය කෙරෙන මෙහෙයුම් ප්‍රදේශයක් ලෙස පාරිභෝගික ජනතාව 500,000 කට වැඩි ප්‍රමාණයක් සඳහා සේවය සලසන අතර, කාර්ය මණ්ඩලය 1500 කින් සමන්විත වේ. අප ආයතනයේ විදුලි කාර්මික III ශ්‍රේණිය තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමේ ඕනෑම ශාඛාවක සේවය කිරීමට කැමති විය යුතුය.**

| | | |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | : | අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් එකවරකදී සිංහල හෝ දෙමළ සමග ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම. |
| වෘත්තීය සුදුසුකම් | : | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන තලය (NVQ- Level 4) යටතේ වන අදාළ ක්ෂේත්‍රයේ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා සහතිකපත් ලබා තිබිය යුතුය. |
| අතිරේක සුදුසුකම් | : | කාර්යාලවල භාවිතා කරන මෘදුකාංග පිළිබඳ දැනුම, හැකියාව හා පළපුරුද්ද හා / හෝ "D" පංතියට අදාළ වාහන පැදවීමේ පළපුරුද්ද ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| වයස් සීමාව | : | 2022.04.04 දිනට අවුරුදු 40 ට අඩු විය යුතුය. |

අයදුම්කරුවන් පත්වීම් සඳහා තෝරා ගැනීමට ප්‍රථම සම්මුඛ පරීක්ෂණයකට සහ වෘත්තීය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

කරුණාකර ඔබගේ විස්තරාත්මක ජීවදත්ත ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් අංක සහිතව, 2022.04.04 වන දින හෝ ඊට පෙර පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

අයදුම්කරනු ලබන තනතුරු නාමය අදාළ අයදුම්පතෙහි හා කවරයෙහි වම් ඉහළ කෙළවරෙහි සඳහන් කළ යුතුය.

**අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)**
**සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම,**
**3 වන මහල, ඊ. එච්.කුරේ ගොඩනැගිල්ල, 411, ගාලුපාර, කොළඹ 03.**